# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 10
- විෂයය - ඉතිහාසය
- පාඩම - 09- පුනරුදය (1 කොටස )


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# පුනරුදය

9 පාඩම



## ➢ හැඳින්වීම

ක්‍රිස්තු වර්ෂ දාහතරවන සියවසේ සිට දාසයවන සියවස දක්වා යුරෝපයේ කලාත්මක හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල සිදු වූ පුළුල් පරිවර්තනය හැඳින්වීම සඳහා ඉතිහාසඥයෝ පුනරුදය යන වචනය යොදති.

❖ පුනරුදය යන්නෙහි මතුපිට අර්ථය වන්නේ යළි පිබිදීම යන්නයි

- ➢ පුනරුදය සිදුවූයේ යුරෝපයේ ය
- ➢ යුරෝපා ඉතිහාසය ප්‍රධාන අවධි තුනකට බෙදා දැක්විය හැකිය

**1. පැරණි යුගය**

පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර ක්‍රියාත්මක වූ අවධියයි



**2. මධ්‍යතන යුගය**

ග්‍රීක රෝම ශිෂ්ටාචාර බිඳ වැටීමෙන් පසු ගතවූ
වසර 1000 ක කාලයයි

**3. නූතන යුගය**

පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාර පිළිබඳව
උනන්දුවක් ඇතිවී පුනරුදය සිදු වූ අවධියයි

පැරණි යුගය → මධ්‍යතන යුගය → නූතන යුගය

# ➢ පුනරුදය ඇති වීමට බලපෑ හේතු



- 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන්ට යටත් වීම
- වෙළෙඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහි වීම
- බුද්ධි ප්‍රබෝධය
- පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම

# ❑ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අතට පත්වීම

- මේ කාලයේ පැවති ඉතා දියුණු වෙළෙඳ නගරයක් වූ කොන්ස්තන්තිනෝපලය ක්‍රි.ව 1453 දී තුර්කීන් විසින් අල්ලා ගන්නා ලදී


- එම නගරයේ පුස්තකාලවල වටිනා ග්‍රීක රෝම පොත්පත් තිබුණි

- තුර්කි ආක්‍රමණය අවස්ථාවේදී එහි වැසියෝ ග්‍රීක රෝම පොත් පත් රැගෙන අසල්වැසි යුරෝපා රටවලට පැන ගියහ


- එහි ප්‍රතිඵල ලෙස ග්‍රීක රෝම සංස්කෘතිවල යළි පිබිදීමක් ඇතිවිය







Bucharest
Ankara
Athens
maphill
© 2011 Maphill

කොන්ස්තන්තිනෝපලය


බුද්ධිමතුන් යුරෝපයේ රටවලට පලා යාම
එංගලන්තය
ප්‍රංශය
ඉතාලිය
EUROPA

## ❑ වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම

- මේ කාලය වන විට වෙළඳාම දියුණු වීම නිසා ඉතාලියේ ධනවතුන් පිරිසක් බිහිවිය

- ඔවුන් කලා කටයුතු කෙරෙහි වැඩි අවධානයක් දැක්වූහ

- සිය ධනය වැයකර කලා කටයුතුවලට අනුග්‍රහ දැක්වූහ

- පුනරුදය ඉතාලියෙන් ආරම්භ වීමට එය ප්‍රබල හේතුවක් විය



උදා : ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරයේ මෙඩිසි පවුල



# ෆ්ලෝරන්ස් නගරය


AUSTRIA
SWITZERLAND
HUNGARY
SLOVENIA
FRANCE
BOSNIA AND
HERZEGOVINA
CROATIA
Florence
ITALY
ADRIATIC SEA
Rome
TYRRHENIAN
SEA
© 2010 EB, Inc.
World Heritage Site

## ❑ බුද්ධි ප්‍රබෝධය

- මධ්‍යතන යුගයේදී යුගයේ දී ආගමික ආයතන මුල්කරගත් අධ්‍යාපන ක්‍රමයක් පැවතුණි
- දේවධර්මය ,දර්ශනය ,නීතිය වැනි විෂයයන් කිහිපයක් පමණක් උගන්වන ලදී
- නමුත් නූතන යුගයේ බිහි වූ නව අධ්‍යාපන ආයතනවල **සාහිත්‍යය , ශබ්ද විද්‍යාව ,ඉතිහාසය** වැනි නව විෂයන් රැසක් උගන්වන ලදී
- එනිසා නව උගතුන් බිහි වීම පුනරුදයට බලපෑ කරුණක් විය
- **ජොහැන්නස් ගුටන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය** නිපදවීමද බුද්ධි ප්‍රබෝධයට බලපෑ කරුණකි
- එනිසා ග්‍රීක රෝම පොත් පත් විශාල වශයෙන් මුද්‍රණය විය
- එය පුනරුදයේ ගමන්මග වේගවත් කිරීමට බලපෑ සාධකයක් විය




# ❑ පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම

- එංගලන්තයේ ➡ ජොන් වයික්ලිප්
- බොහිමියාවේ ➡ ජෝන් හස්
- ප්‍රංශයේ ➡ ඉරාස්මස්
- ජර්මනියේ ➡ මාර්ටින් ලූතර්




ජර්මනියේ -මාර්ටින් ලූතර්- පව් සමාකිරිමට විරුද්ධව පල්ලියෙහි දොරෙහි අලවන ලද පත්‍රිකාව

## ➢ යුරෝපයේ වෙනස් වීමට පුනරුදය බලපෑ ආකාරය

- ශාස්ත්‍රීය පුනරුදය
- භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනය
- මානවවාදය
- කලා ශිල්ප
- විද්‍යාත්මක දියුණුව
- විශ්වය පිළිබඳව ඉදිරිපත් වූ නව මත
- වෛද්‍ය විද්‍යාවේ දියුණුව
- දේශපාලන නවෝදය
- ආර්ථික නවෝදය
- නව වෙළෙඳ මාර්ග සොයා ගැනීම

## ශාස්ත්‍රීය පුනරුදය

ශාස්ත්‍රීය පුනරුදය වශයෙන් සලකන්නේ පහළොස්වන සියවසේ යුරෝපයේ

- භාෂාව
- සාහිත්‍ය
- කලා ශිල්ප (චිත්‍ර කලාව ,ප්‍රතිමා කලාව, ගෘහ නිර්මාණ ශිල්පය)

ආදි අංශයන්හි ඇති වූ ප්‍රබෝධය යි.

## භාෂාව හා සාහිත්‍යයේ පුනර්ජීවනය

- මධ්‍යතන යුගයේදී යුරෝපා රටවල ගෝත්‍රික භාෂා භාවිත විය
- නමුත් පුනරුද යුගයේදී ග්‍රීක රෝම භාෂාවල නවෝදයක් ඇති විය
- එම භාෂා ඉගෙනීම විලාසිතාවක් බවට පත් විය
- එම භාෂා ඉගෙනීමේ ප්‍රතිඵලයක් ලෙස නව ගත් කතුවරු රැසක් බිහිවිය

| | |
|---|---|
| ඉතාලියේ | ඩාන්ටේ<br>පෙට්රාක්<br>බොකැෂියෝ |
| එංගලන්තයේ | සර් තෝමස් මුවර්<br>ප්‍රැන්සිස් බේකන්<br>විලියම් ෂේක්ස්පියර් |
| ප්‍රංශයේ | ඉරාස්මස් |

## ඉතාලියේ



ඩාන්ටේ



පෙට්රාක්



බොකැෂියෝ

## එංගලන්තයේ



ප්‍රැන්සිස් බේකන්



විලියම් ෂෙක්ස්පියර්




සර් තෝමස් මුවර්

- ප්‍රංශයේ



ඉරාස්මස්




අලගියරි ඩාන්ටේ රචනා කළ
ඩිවිනා කොමිඩියා කාව්‍ය ග්‍රන්ථය



පෙට්රාක් රචනා කළ
ලෝරාට සැහැලි කවි


# ❖ මානවවාදය

- මධ්‍යතන යුගයේදී සියල්ලන්ටම වඩා දෙවියන් උසස්ය යන මතය ප්‍රචලිතව තිබුණි
- නමුත් පුනරුද යුගයේ **මිනිසා උසස්ය** යන මතය ප්‍රචලිත විය
- එය **මානවවාදයයි**

එනිසා මෙකල දේවධර්මවාදී විෂයන් වෙනුවට මානවවාදී විෂයන් ඉගෙනීම ආරම්භ විය

උදා :

- **සාහිත්‍යය**
- **ඉතිහාසය**
- **කලාව**
- **නීතිය**
- **ආචාර විද්‍යාව**



# කලා ශිල්ප

## මධ්‍යතන යුගය

- සියලුම ශිල්පීන් ශ්‍රේණි  වශයෙන් සංවිධානය වී සිටියහ
- නිර්මාණ ශ්‍රේණියේ නමින් හැඳින්වුණි
- නිදහස්ව හා ස්වාධීනව නිර්මාණ ඉදිරිපත් කිරීමට ඉඩක් නොලැබුණි
- කලාකෘති ආගමට නැඹුරු විය

## පුනරුද යුගය


- කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීමට ලෞකික රසවින්දනය අගය කරන ධනවතුන් ඉදිරිපත් වීම
- නිර්මාණ කර්තෘගේ නමින් එළි දැක්වීම
- ස්වාධීනව තම දක්ෂතා ඉස්මතු කර නිර්මාණ බිහි විය
- ලෞකික රසවින්දනයට මුල්තැන දීම

## පුනරුද යුගයේ කලා ශිල්පීන්

- චිත්‍ර කලාව → ලියනාඩෝ ඩාවින්චි, මයිකල් ආන්ජලෝ, රෆායල්, මැසෙක්ෂියෝ, බොටිචෙල්ලි
- ප්‍රතිමා කලාව → මයිකල් ආන්ජිලෝ
- ගෘහ නිර්මාණ ශිල්පය → මයිකල් ආන්ජලෝ, ලියානාඩෝ ඩාවින්චි, රෆායල්

## ❑ චිත්‍ර කලාව

### ❖ මධ්‍යතන යුගය





- මධ්‍යතන යුගයේදී චිත්‍ර කලාව ආගමික තේමාවන් ඔස්සේ පමණක් ක්‍රියාත්මක විය
- එකල චිත්‍ර කලාවට ක්‍රිස්තුන් වහන්සේ , කන්‍යා මරියතුමිය වැනි අය වස්තු විෂය විය

## ❖ පුනරුද යුගය

- කලා ශිල්ප අතරින් පුනරුද සමයේ ඉතා පුළුල් වෙනසකට ලක් වූයේ චිත්‍ර කලාවයි
- ඉතාලියේ ෆ්ලෝරන්ස් නගරය නව චිත්‍ර කලාවක් බිහි කළ මධ්‍යස්ථානය විය


- පුනරුද යුගයේ දී ධනවතුන්ගේ අනුග්‍රහය නිසා ලෞකික රසවින්දනය සඳහා ස්වභාවිකත්වයට මුල් තැනදී නිර්මාණ බිහි කරන ලදී



උදා : **රජවරුන්ගේ රූප**
**කුමර කුමරියන්ගේ රූප**
**නිරුවත් සහ අඩ නිරුවත් රූප**

# පුනරුද යුගයේ චිත්‍ර ශිල්පියෝ

## 1.ලියනාඩෝ ඩාවින්චි






ක්‍රිස්තුන් වහන්සේගේ අන්තිම භෝජන සංග්‍රහය




- ලියනාඩෝ ඩාවින්චි කවියෙක් , සංගීතඥයෙක් , විද්‍යාඥයෙක් හා ප්‍රායෝගික ඉංජිනේරුවෙක්ද විය


මොනාලිසා

# 2.මයිකල් ආන්ජිලෝ





ආදම්ගේ චිත්‍රය



අවසාන විනිශ්චය

# සිස්ටයින් දෙව් මැදුර



# 3.රෆායෙල් සැන්ඩි





කන්‍යා මරියතුමිය හා ජේසු බිළින්දා

ඇතැන්ස්හි පාසල





දේව දරුවන් දෙදෙනා

## පුනරුද යුගයේ ප්‍රතිමා ශිල්පීන්


- මයිකල් ආන්ජිලෝ පුනරුද සමයේ සිටි අග්‍රගණ්‍ය ප්‍රතිමා ශිල්පියෙකි
- කිරිගරුඩින් ප්‍රතිමා නෙළීම මෙකල කැපී පෙනෙන ලක්ෂණයකි



### මයිකල් ආන්ජිලෝගේ ප්‍රතිමා

- දාවිත්ගේ ප්‍රතිමාව
- පියෙටා ප්‍රතිමාව
- මොසෙස්ගේ ප්‍රතිමාව
- ලොරෙන්සෝ මෙඩිසිගේ ප්‍රතිමාව


# මයිකල් ආන්ජිලෝගේ ප්‍රතිමා



දාවිත්ගේ ප්‍රතිමාව




පියෙටා ප්‍රතිමාව



මෝසෙස්ගේ ප්‍රතිමාව



ලොරෙන්සෝ මෙඩිසිගේ ප්‍රතිමාව

# ❑ මධ්‍යතන යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය



උල් කේතුක හැඩයෙන් යුත් ආරුක්කු



උස් වහල



උස් වහල හා පිරමීඩ හැඩයේ කුලුනු

# ❑ පුනරුද යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය


උස් වූ කුළුණු



අර්ධ ගෝලාකාර ශිඛර



වටකුරු ආරුක්කු



## ❑ පුනරුද යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය මැනවින් පිළිබිඹු කරන ගොඩනැගිලි

- රෝමයේ ශාන්ත පීතර බැසිලිකා දේවස්ථානය





- ෆ්ලොරන්ස්හි ආසන දෙව්මැදුර

